01) රැකියාවෙන් ලත් අත්දැකීම් හා පලපුරුද්ද ක්‍රීඩා,නර්තන,ගායනා වැනි පෞද්ගලික හැකියා යොදා ගැනීමෙන් ව්‍යාපාර ජනනය වේ.මෙය,

1.විනෝදාංශ හා ලැදියා ව්‍යාපාර අදහසක් බවට පත්වීම වේ.
2.පුද්ගල දක්ෂතා හා පලපුරුද්ද තුළින් ව්‍යාපාර අදහස් මතුවීම වේ.
3.වෙළෙඳපල සමීක්ෂණ තුළින් ව්‍යාපාර අදහස් මතුවීම වේ.
4.නිර්මාණශීලී චින්තන හැකියා තුළින් ව්‍යාපාර අදහස් මතුවීම වේ.

02) ව්‍යාපාරය සඳහා කෙතරම් කැපවිය හැකිද,ඊට පදනම් වන භාණ්ඩය හෝ සේවාව කුමක්ද යනු,

1.ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ගත යුතු තීරණයකි.
2.ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමේදී ගත යුතු තීරණයකි.
3.නිර්මාණශීලී චින්තනයකි.
4.මෙම කිසිවක් නොවේ.

03) ඔබට පහත දැක්වෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අවස්ථාව ලැබී ඇත.එම භාණ්ඩ පාරිභෝගික කොටස් අනුව නිෂ්පාදනය කොට ඉදිරිපත් කරන ආකාරය දක්වන්න.

(A) අධ්‍යාපනික පුවත්පත්
(B) පාවහන්
(C) කාන්තා අත්බෑග්

1.රැකියා කරන කාන්තාවන්ට,පාසල් ළමුන්ට,ජනතාවට
2.පාසල් ළමුන්ට,රැකියා කරන කාන්තාවන්ට,ජනතාවට
3.පාසල් ළමුන්ට,ජනතාවට,රැකියා කරන කාන්තාවන්ට
4.ජනතාවට,පාසල් ළමුන්ට,රැකියා කරන කාන්තාවන්ට

04) ව්‍යාපාරයට ප්‍රාග්ධනය සපයන පුද්ගලයින් ලෙස හඳුන්වනුයේ,

1.කළමණාකරුවන්
2.සම්පත්
3.අයිතිකරුවන්
4.සේවකයින්

05) ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසරයට අයත් වන සාධක තෝරන්න.

1.අයිතිකරුවන්,සේවකයින්,සැපයුම්කරුවන්
2.අයිතිකරුවන්,තරඟකරුවන්,සැපයුම්කරුවන්
3.සේවකයින්,තරඟකරුවන්,සැපයුම්කරුවන්
4.අයිතිකරුවන්,සේවකයින්,කළමණාකරුවන්